සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

**දෙවන වාර පරීක්ෂණය - 10 ශ්‍රේණිය - 2023**
**Second Term Test - Grade 10 - 2023**

# භූගෝල විද්‍යාව - I

කාලය පැය 03 යි

නම/ විභාග අංකයඃ

<u>උපදෙස් :</u>

- මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න 40 කින් සමන්විත වේ.
- එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති උපදෙස්වලට අනුකූලව සියලුම ප්‍රශ්නවලට මෙම පත්‍රයේම පිළිතුරු සපයන්න.

---

- ප්‍රශ්න අංක 01 සිට 10 තෙක් ප්‍රශ්නවල එක් එක් හිස් තැනට ගැළපෙන පිළිතුර වරහන් තුළින් තෝරා තිත් ඉර මත ලියන්න.

01. පෘථිවි පද්ධතිය උප පද්ධති ........................................ සමන්විත වේ. (තුනකින් / හතරකින් / පහකින්)

02. පෘථිවි කබොල සහ ප්‍රාවරණයේ ඉහළ කොටස ඇතුළත් කලාපය ........................................ ලෙස හැඳින් වේ. (ජෛවගෝලය / වායුගෝලය / ශිලාගෝලය)

03. ප්‍රාවරණය තුළ ක්‍රියාත්මක වන ........................................ වල බලපෑම නිසා භූ තැටි චලනය වේ. (භූමිකම්පා / සංවහන ධාරා / සම්පීඩන බලවේග)

04. ඕස්ට්‍රේලියා මහාද්වීප තටකය තුළ පිහිටි දූපතකට නිදසුනක් වන්නේ, ........................................ දූපතය. (බෝර්නියෝ / තස්මේනියා / ජාවා)

05. හිමාලය කඳු පන්තියේ ඇති ........................................ සානුව මුහුදු මට්ටමේ සිට වඩාත් උසින් පිහිටා ඇති සානුවයි. (ටිබෙට් / ඩෙකෑන් / පාමීර්)

06. දකුණු පළාතට අයත් ........................................, ශ්‍රී ලංකාවේ සුළු පොල් ත්‍රිකෝණයට අයත් ප්‍රදේශයකි. (මාතර / තංගල්ල / ගාල්ල)

07. ලෝකයේ දේශගුණය පිළිබඳව මුල් ම අදහසක් ඉදිරිපත්කරනු ලැබුවේ ක්‍රි. පූ. 384 දී පමණ ජීවත් වූ ග්‍රීක ජාතික ........................................ විසිනි. (ඇරිස්ටෝටල් / මිලර් / ටොලමි)

08. ශ්‍රී ලංකාවේ තේ වගාකරන දිස්ත්‍රික්ක අතරින් මැදරට තේ වගාව සඳහා ........................................ දිස්ත්‍රික්කය වැදගත් වේ. (නුවරඑළිය / රත්නපුරය / බදුල්ල)

09. පෘථිවියේ ගොඩබිම ඇති ජල ප්‍රමාණයෙන් සියයට ........................................ පමණ අයිස් තට්ටු හා ග්ලැසියර්වල මිදුණු ජලය ලෙස පවතී. (79 / 97.5 / 71)

10. 1 : 50 000 භූ ලක්ෂණ සිතියමක දැක්වෙන ........................................ සංස්කෘතික ලක්ෂණයකට නිදසුනකි. (වනාන්තර / වැව / ගංගා)

- අංක 11 සිට 15 තෙක් දී ඇති එක් එක් ප්‍රකාශය නිවැරදි නම් ''නි'' යන්න වටා ද, වැරදි නම් ''වැ'' යන්න වටා ද රවුමක් අඳින්න.

11. ශ්‍රී ලංකාවේ වගා බිම් ප්‍රමාණයෙන් 28 % ක් පමණ පොල් වගාවට යොදාගෙන ඇත. (නි / වැ)

12. ඓන්ද්‍රීය පොහොර ප්‍රචලිත කිරීම සඳහා කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගෝනවල මාකඳුර කාබනික පොහොර මධ්‍යස්ථානය පිහිටුවා ඇත. (නි / වැ)

13. ශාකපත්‍ර තුළින් සිදුවන වාෂ්පීකරණය මගින් වායුගෝලයට ජලය එකතු වේ. (නි / වැ)

14. සුවිශේෂී කරුණක් දැක්වීම සඳහා පමණක් නිර්මාණය කර ඇති සිතියම් භූ ලක්ෂණ සිතියම් වේ. (නි / වැ)

15. චීන ජාතිකයන් විසින් සොයාගන්නා ලද තේ ලෝකයේ සෑම රටකම පාහේ බහුලව භාවිත කරන පානයකි. (නි / වැ)

- ප්‍රශ්න අංක 16 සිට 20 තෙක් දී ඇති ප්‍රශ්නවල ''අ'' සහ ''ආ'' යනුවෙන් තීරු දෙකක් දැක්වේ. ''අ'' තීරුවේ ඇති තොරතුරුවල අනුපිළිවෙළට අනුව ''ආ'' තීරුවේ ඇති තොරතුරු ගැලපූ විට නිවැරදි අනුපිළිවෙළ දැක්වෙන පිළිතුරට හිමි අංකය ඉදිරියේ ඇති තිත් ඉර මත ලියා දක්වන්න.

16. ''අ'' — ''ආ''

| කඳුවැටිය | | පිහිටි මහාද්වීපය |
|---|---|---|
| 1. ඇට්ලස් | A | දකුණු ඇමරිකා |
| 2. අල්තායි | B | යුරෝපා |
| 3. අන්දීස් | C | අප්‍රිකා |
| | D | ආසියා |

(1) DCB (2) CDA (3) DCA (4) BDA (.........)

17. ''අ'' — ''ආ''

| ප්‍රධාන සාගර | | පිහිටා ඇති මුහුද |
|---|---|---|
| 1. පැසිපික් සාගරය | A | කැරිබියන් මුහුද |
| 2. අත්ලන්තික් සාගරය | B | බැරන්ට්ස් මුහුද |
| 3. ඉන්දියන් සාගරය | C | කහ මුහුද |
| | D | අරාබි මුහුද |

(1) CAD (2) CAB (3) DBC (4) BCA (.........)

18. ''අ'' — ''ආ''

| මහාද්වීපය | | විල |
|---|---|---|
| 1. අප්‍රිකා | A | සුපිරියර් |
| 2. උතුරු ඇමරිකා | B | බෝල්කෑෂ් |
| 3. ඔස්ට්‍රේලියා | C | නියාසා |
| | D | අයර් |

(1) DCB (2) BAD (3) CAD (4) CBA (.........)

19. ''අ'' — ''ආ''

| බෝගය | | පර්යේෂණ ආයතන පිහිටි ප්‍රදේශය |
|---|---|---|
| 1. රබර් | A | තලවකැලේ |
| 2. පොල් | B | අගවත්ත |
| 3. තේ | C | බතලගොඩ |
| | D | ලුණුවිල |

(1) ACD (2) DBC (3) BAC (4) BDA (.........)

20. ''අ'' — ''ආ''

| රට | | වී වගාකරන ගංගා නිම්නය |
|---|---|---|
| 1. ඇමරිකා එක්සත් ජනපදය | A | පෝ. ගංගා නිම්නය |
| 2. ඔස්ට්‍රේලියාව | B | මිසිසිපි ගංගා නිම්නය |
| 3. ඉතාලිය | C | මරේඩාලිං ගංගා නිම්නය |
| | D | නයිල් ගංගා නිම්නය |

(1) BCA (2) CDA (3) DCA (4) BDA (.........)

- අංක 21 සිට 26 තෙක් දී ඇති ප්‍රශ්නවලට හිස්තැන්වලට සුදුසු වචන යොදා සම්පූර්ණ කරන්න.

21. ලෝකයේ ගැඹුරු ම සාගරික ආගාධය ........................................................... ආගාධය වේ.

22. අප්‍රිකා මහද්වීපයේ පිහිටි නයිල් ගඟ ආරම්භ වන්නේ ........................................................ විලෙනි.

23. මහාද්වීප මායිමේ පිහිටි සාගරය දෙසට පැතිරීගිය නොගැඹුරු මුහුදු තීරය ............................................ ලෙස හැඳින් වේ.

24. හවායි දූපත් නිර්මාණය වී ඇත්තේ ගැඹුරු සාගරයේ ...................................................... ක්‍රියාකාරීත්වයේ ප්‍රතිඵලයක් ලෙසය.


25. කඳුකරයේ බෑවුම් සහිත ප්‍රදේශවල වී වගාව ........................................................... ක්‍රමයට සිදු වේ.

26. ශ්‍රී ලංකාවේ කිරිගව සම්පත් හුවමාරු මධ්‍යස්ථානය ................................................................... ප්‍රදේශයේ පිහිටුවා ඇත.

- **ප්‍රශ්න අංක 27 හා 28 ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේ දී පහත සඳහන් ප්‍රස්තාරය උපයෝගී කර ගන්න.**

27. ඉහත ප්‍රස්තාර සටහනේ වැඩිම අපනයන සංයුතියක් දක්වන භෝගය ............................................වේ.

28. ප්‍රස්තාර සටහනට අනුව අඩුම අපනයන සංයුතියක් දක්වන භෝගය .................................................වේ.




- **අංක 29 සිට 37 තෙක් ඇති එක් එක් ප්‍රශ්නයට දී ඇති පිළිතුරු හතර අතරින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරා ඊට හිමි අංකය ඉදිරියෙන් ඇති තිත් ඉර මත ලියන්න.**

29. යුරෝපයේ ව්‍යාපාරික කිරිපට්ටි පාලනය කෙරෙන රටවල් අතර ප්‍රමුඛත්වය ගන්නා රට වන්නේ කුමක් ද?

(1) ප්‍රංශය (2) බ්‍රිතාන්‍යය (3) ඩෙන්මාර්කය (4) නෙදර්ලන්තය

(.........)

30. ආසියාවෙන් බැහැරව වී වගා කරන ප්‍රදේශයකට නිදසුනකි,

(1) මැඩගස්කරය (2) තායිලන්තය (3) මියන්මාරය (4) ජපානය (.........)

31. වතු භෝගයක් වන රබර් වගාව ශ්‍රී ලංකාවට හඳුන්වා දුන් බ්‍රිතාන්‍ය ජාතිකයා වන්නේ,

(1) ජේම්ස් ටේලර් (2) හෙන්රි වික්හැම් (3) රොබට් නොක්ස් (4) ආතර් සී ක්ලාක් (.........)

32. තේ වගාව සඳහා වඩාත් යෝග්‍ය පාංශු වර්ගය කුමක් ද?

(1) ලවණ මිශ්‍ර ලුණු පස (2) රතු දුඹුරු පස

(3) දියළු පස (4) ලෝම් හා ලැටරයිට් පස (.........)

33. මාෂ භෝග සඳහා පර්යේෂණ මධ්‍යස්ථානය පිහිටුවා ඇත්තේ,

(1) මාතලේ ය. (2) අගුණකොළපැලැස්සේ ය.

(3) ගන්නෝරුවේ ය. (4) බට අත ය. (.........)

34. ශ්‍රී ලංකාවේ නිෂ්පාදිත උසස් තත්වයේ තේ මිල දී ගන්නා ප්‍රධාන කලාපය කුමක් ද?

(1) මැදපෙරදිග කලාපය (2) දකුණු ආසියාව

(3) යුරෝපා කලාපය (4) ලතින් ඇමරිකානු කලාප (.........)

35. සම්පූර්ණයෙන් ම ගොඩබිමෙන් වට වූ මුහුදක ට නිදසුනක් වන්නේ,

(1) රතු මුහුද (2) බෝල්ටික් මුහුද (3) එරල් මුහුද (4) චීන මුහුද (........)

36. ශ්‍රී ලංකාව 1 : 50 000 පරිමාණයට අනුව බෙදා ඇති සිතියම් කොටස් ගණන කීය ද?

(1) 94 (2) 96 (3) 98 (4) 92 (.........)

37. ශ්‍රී ලංකාවේ සුළු අපනයන භෝගයක් ලෙස පැඟිරි වගාව ව්‍යාප්ත වී ඇති දිස්ත්‍රිකය කුමක් ද?

(1) හම්බන්තොට (2) යාපනය (3) කුරුණෑගල (4) බදුල්ල (.........)

- **පහත A B C හා D වලින් දක්වා ඇති එකිනෙකට සම්බන්ධ මාතෘකා යුගලය හොඳින් අධ්‍යයනය කර අංක 38 සිට 40 තෙක් දී ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

A = 1. මරණ අනුපාතය
 2. ආයු අපේක්ෂාව

B = 1. වියපත්වීම.
 2. සංක්‍රමණ

C = 1. වායුගෝලය
 2. පොසිල ඉන්ධන

D = 1. සූර්ය ලප
 2. ගෝලීය උණුසුම

38. පළමුවැන්න වැඩිවීම දෙවැන්න වැඩිවීමට හේතුවක් වන බවට දැක්විය හැකි මාතෘකා යුගලය කුමක්ද?

(1) A (2) B (3) C (4) D

39. පළමුවැන්න අඩුවීම දෙවැන්න වැඩිවීමට හේතුවක් වන බවට දැක්විය හැකි මාතෘකා යුගලය කුමක් ද?

(1) A (2) B (3) C (4) D

40. පළමුවැන්නේ පැවැත්මට දෙවැන්න අහිතකර ලෙස බලපෑ හැකි බවට දැක්විය හැකි මාතෘකා යුගලය කුමක් ද?

(1) A (2) B (3) C (4) D

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

## දෙවන වාර පරීක්ෂණය - 10 ශ්‍රේණිය - 2023
## Second Term Test - Grade 10 - 2023

# භූගෝල විද්‍යාව - II

නම/ විභාග අංකයඃ

- මෙම ප්‍රශ්න පත්‍රය I, II වශයෙන් කොටස් දෙකකින් සමන්විතය.
- I කොටසේ ප්‍රශ්නය අනිවාර්ය වේ. එහි (අ) , (ආ) සහ (ඉ) කොටස් තුනටම පිළිතුරු සැපයිය යුතුයි.
- II කොටසින් ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න. පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව පහකි.

---

## I - කොටස

(01) (අ) (i) සිතියම් නිර්මාණය සඳහා භාවිතවන නව තාක්ෂණික ශිල්ප ක්‍රම දෙකක් ලියන්න. (ල. 02)


(ii) ප්‍රධාන සිතියම් වර්ග දෙක සඳහන් කරන්න. (ල. 02)

(iii) ශ්‍රී ලංකාවේ 1 : 50 000 භූ ලක්ෂණ සිතියමක ඉහළ වටතීරුවේ සඳහන්වන තොරතුරු 02 ක් ලියන්න. (ල. 01)

(iv) 1 : 50 000 භූ ලක්ෂණ සිතියම්වල පරිමාණය දක්වන ක්‍රමයක් ලියන්න. (ල. 01)

(v) 1 : 50 000 භූ ලක්ෂණ සිතියම්වල එක් සිතියම් පත්‍රයකින් භූමියේ ආවරණයවන වර්ග ප්‍රමාණය වර්ගකිලෝමීටර් කොපමණ ද? (ල. 01)

(vi) පහත රූප සටහන්වල දැක්වෙන භූ ලක්ෂණ මොනවාදැයි A, B, C පිළිවෙලින් දක්වන්න. (ල. 03)




(ආ) ඔබ වෙත සපයා ඇති ලෝක සිතියම හොඳින් අධ්‍යයනය කර පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

අංක I සිට V තෙක් එක් එක් ප්‍රශ්නයට ඉදිරියෙන් දී ඇති ඉංග්‍රීසි අක්ෂර තුන අතුරෙන් නිවැරදි පිළිතුර දැක්වෙන අක්ෂර සිතියමෙන් තෝරා සිතියමට යාබදව ඇති තීරුවේ එක් එක් ප්‍රශ්න අංක ඉදිරියේ ඇති කොටුව තුළ ලියා දක්වන්න.

(i) බෝල්ටික් මුහුද — A, B, C

(ii) අයර් විල — D, E, F

(iii) රොකි කඳුවැටිය — G, H, I

(iv) අරාබි සානුව — J, K, L

(v) ෆෝක්ලන්ඩ් දූපත් — M, N, P

(ඉ) ඔබ වෙත සපයා ඇති ශ්‍රී ලංකා සිතියම හොඳින් අධ්‍යයනය කර පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

අංක I සිට V තෙක් එක් එක් ප්‍රශ්නයට ඉදිරියෙන් දී ඇති ඉංග්‍රීසි අක්ෂර තුන අතරින් නිවැරදි පිළිතුර දැක්වෙන අක්ෂර සිතියමෙන් තෝරා සිතියමට යාබද ඇති තීරුවේ එක් එක් ප්‍රශ්න අංක ඉදිරියේ ඇති කොටුව තුළ ලියා දක්වන්න.

| | | |
|---|---|---|
| (i) | වව්නියා දිස්ත්‍රික්කය | A, B, C |
| (ii) | කෝකිලායි කලපුව | D, E, F |
| (iii) | පෙඩ්රෝ මුතුපරය | G, H, I |
| (iv) | ගාල්ල ධීවර වරාය | J, K, L |
| (v) | පම්බල | M, N, O |


02. (i) පෘථිවි පෘෂ්ඨය නිර්මාණය වී ඇති ප්‍රධාන භූ තැටි දෙකක් ලියන්න. (ල. 02)

(ii) (a) පෘථිවි කබොල ඉහළ ප්‍රාවරණයෙන් වෙන්කරන සීමාව හඳුන්වන නම ලියන්න.

(b) පෘථිවි කබොලේ විශේෂ ලක්ෂණ දෙකක් ලියන්න. (ල. 03)

(iii) (a) රූප සටහනේ A හා B වලින් දැක්වෙන දේශගුණික කලාප දෙක නම් කරන්න.

(b) ඉහත ඔබ නම් කළ A කලාපයේ දක්නට ලැබෙන විශේෂ ලක්ෂණ තුනක් ලියන්න. (ල. 05)





03. පහත රූප සටහනෙන් දක්වා ඇත්තේ වායුගෝලයේ ස්තරයන් ය.

(i) (a) A ස්තරය නම් කරන්න.


(b) B ස්තරයේ 20-30km අතර පිහිටා ඇති සුවිශේෂී ස්තරය නම් කරන්න. (ල. 02)

(ii) A ස්තරයේ හඳුනාගත හැකි සුවිශේෂී ලක්ෂණ තුනක් සඳහන් කරන්න. (ල. 03)

(iii) වායුගෝලයට විවිධ බලපෑම් සිදුවන මානව කටයුතු තුනක් නම් කර ඉන් එකක් අවම කර ගැනීමට අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ග විස්තර කරන්න. (ල. 05)



- ප්‍රශ්න අංක (4) සහ (5) සඳහා පිළිතුරු සැපයීමේ දී පහත දැක්වෙන ලෝක සිතියම උපයෝගී කර ගන්න.




04. (i) ඉහත සිතියමේ තිරිඟු වගාකරන ප්‍රධාන රටවල් දෙකක් වන ආජන්ටිනාව හා චීනය දැක්වෙන අක්ෂර දෙක පිළිවෙලින් ලියන්න. (ල. 02)

(ii) තිරිඟු වගාව ව්‍යාප්තවීමට හේතුවන භෞතික සාධක පහත සඳහන් ශීර්ෂ යටතේ ලියන්න. (ල. 03)

a. - වර්ෂාපතනය -

b. - පස -

c. - භූමිය -

(iii) (a) ලෝක වෙළඳපලේ තිරිඟු ප්‍රධාන භෝගයක් ලෙස වැදගත් වීමට බලපා ඇති හේතු දෙකක් ලියන්න.

(b) තිරිඟු වගාව ආශ්‍රිත විශේෂ ලක්ෂණ තුනක් සඳහන් කරන්න. (ල. 05)

05. (i) කර්මාන්ත ස්ථානගතවීමට බලපාන සාධක දෙකක් ලියන්න. (ල. 02)

(ii) (a) ලෝකයේ යකඩ හා වානේ නිෂ්පාදනය කරන රටවල් දෙකක් A හා D වලින් දැක්වේ. එම රටවල් දෙක නම් කරන්න.

(b) ඉහත A රටෙහි යකඩ හා වානේ කර්මාන්තය ස්ථානගත වීමට බලපා ඇති සාධකයක් ලියන්න. (ල. 03)

(iii) (a) යකඩ හා වානේවල ඇති ගුණාංග දෙකක් ලියන්න.

(b) යකඩ හා වානේ කර්මාන්තය ආශ්‍රිත ප්‍රවණතා දෙකක් සඳහන් කර ඉන් එක්ක විස්තර කරන්න. (ල. 05)

06. (i) ශ්‍රී ලංකාවේ වී පර්යේෂණ ආයතන පිහිටි ස්ථාන 02 ක් ලියන්න. (ල. 02)

(ii) (a) ශ්‍රී ලංකාවේ තෙත් කලාපයේ වී වගාකරන දිස්ත්‍රික්කයක්

සහ

(b) තෙත් කලාපයේ කෙරෙන වී වගාවේ විශේෂ ලක්ෂණ දෙකක් ලියන්න. (ල. 03)

(iii) (a) වර්තමානයේ වී වගාව ආශ්‍රිතව පැනනැගී ඇති ගැටළු දෙකක් ලියන්න.

(b) වී වගාව ආශ්‍රිත ගැටළු විසඳීම සඳහා රජය ගෙන ඇති ක්‍රියාමාර්ග තුනක් ලියන්න. (ල. 05)

07. (i) ශ්‍රී ලංකාවේ නිෂ්පාදිත රබර් අපනයන කරන යුරෝපා සංගමයේ රටවල් දෙකක් ලියන්න. (ල. 02)

(ii) ශ්‍රී ලංකාවේ තෙත් කලාපයේ රබර් වගාව ව්‍යාප්තවීමට බලපා ඇති පහත සඳහන් භෞතික සාධක සඳහන් කරන්න.

a - වර්ෂාපතනය

b - පස

c - උෂ්ණත්වය

(iii) (a) ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික නොවන සුළු අපනයන භෝග දෙකක් ලියන්න.

(b) ශ්‍රී ලංකා රජය සුළු අපනයන භෝග කෙරෙහි විශේෂ අවධානයක් යොමු කිරීමට බලපෑ හේතු දෙකක් කෙටියෙන් විස්තර කරන්න. (ල. 05)

08. (i) ශ්‍රී ලංකාවේ අනන්‍ය ආර්ථික කලාපය තුළ සිදු කරන කරදිය ධීවර කර්මාන්තයේ ප්‍රධාන අංශ දෙක ලියන්න. (ල. 02)


(ii) (a) කිවුල්දිය ධීවර කර්මාන්තය යටතේ ඇතිකරනු ලබන මත්ස්‍ය වර්ගය සහ

(b) කිවුල්දිය ධීවර කර්මාන්තය සිදු කරන ප්‍රධාන ප්‍රදේශ දෙකක් ලියන්න. (ල. 03)

(iii) (a) ධීවර කර්මාන්තය ආශ්‍රිතව පැනනැගී ඇති ගැටළු දෙකක් ලියන්න.

(b) ශ්‍රී ලංකාවේ ආර්ථිකයට ධීවර කර්මාන්තය වැදගත් වන ආකාරය කරුණු 03 ක් මගින් දක්වන්න. (ල. 05)

01 (ආ) / (B) 10 ශ්‍රේණිය - භූගෝල විද්‍යාව Grade 10 - Geography




(i)

(ii)


(iii)

(iv)

(v)

/5

01 (ඉ) / (C)




(i)

(ii)

(iii)

(iv)

(v)

/5

01 (අ)(A) /10 + (ආ)(B) /5 + (ඉ)(C) /5 = /20

## පිළිතුරු පත්‍රය - I පත්‍රය

| | | | |
|---|---|---|---|
| 01. හතරකින් | 11. නි | 21. මරියානා | 31. 2 |
| 02. ශිලාගෝලය | 12. නි | 22. වික්ටෝරියා | 32. 4 |
| 03. සංවහන ධාරා | 13. වැ | 23. මහාද්වීපතටකය | 33. 2 |
| 04. තස්මේනියා | 14. වැ | 24. යමහල් | 34. 1 |
| 05. ටිබෙට් | 15. නි | 25. හෙල්මළු | 35. 3 |
| 06. තංගල්ල | 16. 2 | 26. මීවනපලාන | 36. 4 |
| 07. ඇරිස්ටෝටල් | 17. 1 | 27. තේ | 37. 1 |
| 08. බදුල්ල | 18. 3 | 28. එළවළු | 38. 4 |
| 09. 79% | 19. 4 | 29. 3 | 39. 1 |
| 10. වැව | 20. 1 | 30. 1 | 40. 3 |

(නිවැරදි පිළිතුරට ලකුණු 01 බැගින්) (ලකුණු 40)

## II පත්‍රය

### I - කොටස

01. (අ) (i)
- ගෝලීය ස්ථානගත කිරීමේ පද්ධතිය.
- භූගෝලීය තොරතුරු පද්ධතිය.
- දුරස්ථ සංවේදය (ල. 02)

(ii) භූ ලක්ෂණ සිතියම්, තේමා සිතියම් (ල. 02)

(iii) සිතියමේ නම, පත්‍ර අංකය හා සිතියම් වර්ගය (ල. 01)

(iv) • රේඛීය පරිමාණය • නියෝජ්‍ය පරිමාණය (ල. 01)

(v) $1000km^2$ (ල. 01)

(vi) A - කපොල්ල B - නෙරුව C - නිම්නය (ල. 03)

(ආ) (i) B (ii) F (iii) G (iv) K (v) N (ල. 05)

(ඉ) (i) B (ii) D (iii) I (iv) L (v) N (ල. 05)

02. (i) ඉන්දු ඔස්ට්‍රේලියානු තැටිය / උතුරු ඇමරිකානු තැටිය / දකුණු ඇමරිකානු තැටිය / යුරේසියානු තැටිය / අප්‍රිකානු තැටිය / පැසිපික් තැටිය / ඇන්ටාර්ටික් තැටිය (ල. 02)

(ii) (a) මොහොරොවිසික් අසන්තතිය

(b)
- පෘථිවි ස්කන්ධයෙන් 1 % ක්පමණ අයත්ය.
- ඝනකම ඒකාකාරී නොවේ. සාගරවල දී 5 km පමණ ද මහද්වීපවල දී 60 km පමණ ද ගැඹුරට විහිදේ
- පාෂාණවලින් සමන්විත වේ.
- පෘථිවි කබොල තුනී ස්තරයක් වේ.
- සාගරික කබොල සහ මහද්වීප කබොල වලින් සමන්විත වේ. (ල. 03)

(iii) (a) A - නිවර්තන කලාපය

B - සෞම්‍ය කලාපය

(b)
- පෘථිවියේ උෂ්ණත්වය අධිකම කලාපයයි.
- වසර පුරා ඉහළ උෂ්ණත්වයක් පවතී ($180^0$ වැඩි)
- ඍතු භේදයක් නැත. (තෙත් හා වියළි කාලයක් පවතී.)
- වසර පුරා පැතිරුණු වර්ෂාපතනය.
- අධික වැසි ලබන ප්‍රදේශ මෙන් ම වියළි ප්‍රදේශ ද පවතී. (ල. 05)

03. (i) (a) A = පරිවර්තිගෝලය (b) ඕසෝන් වායු ස්තරය (ල. 02)

(ii) A - පරිවර්තීගෝලය
- පෘථිවියේ සිට 8-12 km පමණ දක්වා ඉහළට විහි දේ.
- ඉහළ යන විට උෂ්ණත්වය අඩු වේ. එය පතන සීඝ්‍රතාව ලෙස හැඳින්වේ.
- එසේ උෂ්ණත්වය අඩුවීම ඉහළ යන සෑම මීටර් 1000 කටම $6.4C^0$ වේ.

- සියලු ම කාලගුණික සංසිද්ධි මෙහි සිදු වේ.
- වායුගෝලයේ මුළු වායු ප්‍රමාණයෙන් 96 % පමණ මෙහි අන්තර්ගත වේ.
- වායු පීඩනය ද උන්නතාංශය සමග අඩු වේ. (ල. 03)

(iii) අහිතකර මානව කටයුතු
- වනාන්තර විනාසය.
- කර්මාන්තශාලා වලින් පිටකරන දුම
- කෘෂි කාර්මික තටයුතුවලින් අහිතකර වායුවර්ග නිකුත් වීම.
- සත්ව පාලන කටයුතු සත්ව අපද්‍රව්‍ය මගින් මීතෙන් වායුව පිට කිරීම.
- ඉන්ධන දහනය. මෙවැනි කටයුතු තුනක් නම් කර ඉන් එක්ක අවමකර ගැනීමට අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ග විස්තර කිරීම. (ල. 05)

04. (i) G හා F (ල. 02)

(ii) a - 300mm - 500mm
b - චර්නෝසම් පස
c - තැනිතලා හෝ රැළි බිම් (ල. 03)

(iii) (a)
- ලෝක ජනගහනයෙන් වැඩිදෙනෙකු පරිභෝජනය කිරීම.
- මහා පරිමාන වශයෙන් වගා කිරීම.
- විවිධාකාර ලෙස සැලසූ ආහාර ලෙස පරිභෝජනය කිරීම.
- මහා පරිමාණ වශයෙන් යන්ත්‍රසූත්‍ර භාවිත කිරීම.
- ලැබෙන අස්වනු ප්‍රමාණය වැඩි වීම.
- අතුරුඵල සත්ව ආහාර ලෙස භාවිත කළ හැකි වීම.

(b)
- ඒක පුද්ගල අස්වනු ප්‍රමාණය වැඩි වීම.
- වගා බිම් විශාල වීම.
- දියුණු තාක්ෂණික ක්‍රම ශිල්පක්‍රම භාවිත කිරීම.
- යාන්ත්‍රිකරණය වීම.
- වැඩි ඵලදායි බීජ භාවිතය.
- පැතිරුණු වෙළඳපලක් පැවතීම. (ල. 05)

05. (i) බලශක්තිය, ප්‍රවාහනය, යටිතල පහසුකම්, අමුද්‍රව්‍ය, ප්‍රාග්ධනය, වෙළඳපල, ශ්‍රමය,රාජ්‍ය ප්‍රතිපත්ති (ල. 02)

(ii) (a) A = ඇමරිකා එක්සත් ජනපදය
D = රුසියාව

(b)
- පරිවහනය සඳහා විල් ජලය භාවිත කිරීම.
- විල් අවටින් මුලින් අමුද්‍රව්‍ය සපයාගත හැකි වීම.
- ඇමරිකා එක්සත් ජනපදයේ පංචමහා විල් අවට යපස් කෙත් රාශියක් පවතී. නිදසුන් මෙසාබි, කියුනා, මනෝමනි, මාර්ක්වෙදම්, ආදී වශයෙන් සුපිරියන් හා මිචිගෝ විල් අවට ප්‍රදේශ යහපත් නිෂ්පාදනයට ප්‍රසිද්ධ වේ. (ල. 03)

(iii) (a) කල්පැවැත්ම, ශක්තිය දරා ගැනීමේ හැකියාව, නම්‍යශීලීබව, කම්පනයට ඔරොත්තු දීම.

(b) ප්‍රවණා - නිෂ්පාදන කටයුතු සඳහා නව තාක්ෂණය භාවිතා කිරීම
භාවිත කිරීම.
- යකඩ උණු කිරීම ගල් අඟුරු වෙනුවට විකල්ප බලශක්තිය යොදා ගැනීම.
- අතීතයේ යකඩ හා වානේ කර්මාන්තයට ප්‍රසිද්ධ වූ ඇතැම් රටවල් (මහා බ්‍රිතාන්‍ය) වෙළඳපොලින් ක්‍රමයෙන් පසු බැසීම
- නැගෙනහිර ආසියා රටවලින් යකඩ හා වානේ සඳහා ඇති ඉල්ලුම ඉහළ යාම.
- විවිධ උපාංග සඳහා භාවිත කිරීම.
- අමුද්‍රව්‍ය මත පදනම් වූ කර්මාන්ත වෙනත් සාධක මත ස්ථානගත වීම. (ල. 05)

06. (i) බතලගොඩ, බෝඹුවල, මහඉලුප්පල්ලම, හිගුරක්ගොඩ, අම්බලන්තොට (ල. 02)

(ii) (a) ගාල්ල, කළුතර, රත්නපුය, කොළඹ, ගම්පහ, කෑගල්ල

(b)
- ගංගා මිටිවයන් සහ පහත් ප්‍රදේශවල වගා කිරීම.
- වර්ෂා ජලයෙන් වගා කිරීම.
- වියළි කලාපයට සාපේක්ෂ අස්වනු අඩු වීම.
- කුඩා බිම් කැබලිවල වගා කරයි.
- ජල ගැලීම්වලට භාජනය වීම නිසා වගා හානිවීම. (ල. 03)

(iii) (a)
- ඉඩම් කැබලි වීම. / ඉඩම් ගොඩ කිරීම.
- එක බිමක දීර්ඝ කාලයක් වගා කිරීම නිසා අස්වනු අඩුවීම නිසා.
- ජල හිගය හා තෙත් කලාපයේ ජල අතිරික්තය.
- යෙදවුම් මිල ඉහළයාම (පොහොර / කෘෂි රසායන ද්‍රව්‍ය)
- අස්වනුවලට නියමිත මිලක් නොමැති වීම.
- මිල දී ගැනීමේ මධ්‍යස්ථාන ප්‍රමාණවත් නොවීම ආදී. ගැටළු.

(b)
- පොහොර සහනාධාරය ලබා දීම.
- වී වලට සහතික මිලක් නියම කිරීම.
- වගා නොකරන ඉඩම් රජයට පවරා ගැනීම.
- ගොවියන්ට රක්ෂණ ක්‍රම, විශ්‍රාම වැටුප් හඳුන්වා දීම.
- වගා හානි සඳහා වන්දි ගෙවීම. (ල. 05)

07. (i) ඔස්ට්‍රියාව, බෙල්ජියම, ප්‍රංශය, ජර්මනිය, ග්‍රීසිය, ඉතාලිය (ල. 02)

(ii) a- 200 mm වැඩි වර්ෂාපතනය

b - කබොක් මිශ්‍ර රතු පස

c - 27C$^0$ පමණ සාමාන්‍ය උෂ්ණත්වය (ල. 03)

(iii) (a) බුලත්, කජු, පැඟිරි, මල් වර්ග, විසිතුරු පැළ, රටකජු

(b)
- සාම්ප්‍රදායික අපනයනවල මිල උච්චාවචනය වීම.
- විදේශ විනිමය පිළිබඳ ගැටළු මතුවීම.
- ලෝක වෙළඳපොළේ සුළු අපනයන භෝගවල ඉල්ලුම වැඩිවීම.
- දේශීය ජනතාවගේ ආදායම වැඩි වීම.
- අතුරුභෝග ලෙස වගා කිරීමට හැකිවීම.
- රැකියා අවස්ථා බිහිවීම වැනි කරුණු වලින් කරුණු 02 ක් ලියා විස්තර කිරීම. (ල. 05)

08. (i)
- වෙරළාසන්න හෙවත් මහද්වීප තටකය තුළ ධීවර කර්මාන්තය
- ගැඹුරු මුහුදේ ධීවර කර්මාන්තය (ල. 02)

(ii) (a) ඉස්සන්, කකුළුවන්

(b) යාපනය, පුත්තලම, මුන්දලම, හලාවත මීගමුව, පොල්වත්තගහ, මලල කලපුව, ආරුගම්බොක්ක.
(ල. 03)

(iii) (a)
- ආම්පන්නවල මිල ඉහළ යාම.
- ඉන්ධන මිල ඉහළ යාම.
- ශිතකරණ ගබඩාකරණ පහසුකම් නොමැති වීම.
- තරුණ පරපුර ධීවර කර්මාන්තයේ නොයෙදීම.
- කාලගුණික බාධා ඇතිවීම.

(b)
- දළ දේශීය නිෂ්පාදනයට දායකවීම.
- විශාල පිරිසක් රැකියාවල නියුක්ත වීම.
- ආහාරවල පෝෂණ වැඩි කිරීමට හේතු වීම.
- අපනයන තුළින් විදේශ විනිමය ඉපයීම. (ල. 05)